# මතකය හා වෙනස්වීම

වස්තුවක මතකය යන්න ද මිනිසාගේ නිර්මාණයකි. වස්තුවකට මතකයක් ඇතැයි අප කිවහොත් ඉන් අදහස්කරන්නේ වස්තුවකට ඇති මතකයක් ගැන නොව වස්තුවේ මතකය යැයි අප විසින් හඳුනාගැනෙන දෙයක් ය. වස්තුව නියමිත පථයක ගමන්කරන්නේ ඇයි දැයි දැනගැනීමට වුවමනා වී ඇත්තේ අපට ය. වස්තුවට එවැනි වුවමනාවක් නැත. පොල්ගෙඩියක් යම් උසක දී නිශ්චලතාවයෙන් අත්හැරියහොත් නිව්ටෝනීය භෞතිකයට අනුව නම් එය ගුරුත්වාකර්ෂණය යටතේ සිරස් ව පහතට ගමන්කරයි. එහි පෙත සිරස් රේඛාවක් වෙයි. එහෙත් ඒ උසින් ම පොල්ගෙඩිය තිරස් ව ප්‍රක්ෂේපනය කළහොත් එය පරාවලාකාර පෙතක ගමන්කරයි. මේ වෙනසට හේතුව අවස්ථා දෙකෙහි දී පොල්ගෙඩියෙහි ආරම්භක අවස්ථාවන්හි නැතහොත් මායිම් අවශ්‍යතාවන්හි අතර ඇති වෙනස ය. මේ ආරම්භක අවස්ථාවෙහි පොල්ගෙඩියට ලබා දෙන (හෝ ලබා නොදෙන) ගම්‍යතාව, ශක්තිය ආදිය ආවේගී වෙනසකට පොල්ගෙඩිය භාජනයවන තුරු පොල්ගෙඩියේ චලිතය පාලනය කරයි. එය එක්තරා ආකාරයකින් ගතහොත් පොල්ගෙඩිය ආරම්භයේ දී සිදු වූ දේ මතක තබාගෙන සිටිනු වැනි දෙයකි. ඒ අරුතින් පොල්ගෙඩියට මතකයක් ඇතැයි අපි කියමු.

කෙසේ හෝ වේවා පොල්ගෙඩියට මතකයක් අවශ්‍යවන්නේ ද පොල්ගෙඩිය යම් ආකාරයකින් වෙනස්වන නිසා ය. ක්ෂණයක් පාසා පොල්ගෙඩියෙහි ප්‍රවේගය වෙනස්වෙයි. එහි ශක්තිය (නිව්ටෝනීය භෞතිකයට අනුව චාලක හා විභව) නොවෙනස්ව පැවතුණ ද, ගම්‍යතාව, ප්‍රවේගය ආදිය වෙනස්වෙයි. පොල්ගෙඩියට මතකයක් අවශ්‍ය වන්නේ ම ඒ වෙනස්වීම යම් නිශ්චිත ආකාරයකින් සන්තතික ව සිදුකිරීමට ය. පොල්ගෙඩිය පොළොවට වැටීමෙන් පසු එය තවදුරටත් සිරස් රේඛාවක හෝ පරාවලයක හෝ ගමන් නො කරයි. පොළොව සමග ගැටීමත් සමග පොල්ගෙඩියට ආවේගයක් ලබාදීම හේතුවෙන් එහි ප්‍රවේගයෙහි හා ගම්‍යතාවයෙහි පමණක් නොව ශක්තියෙහි ද වෙනසක් සිදුවෙයි. එවිට පොල්ගෙඩියට කලින් තිබූ ශක්තිය පිළිබඳ මතකයක් නො වෙයි. දැන් පොල්ගෙඩියට ඇත්තේ වෙනත් ශක්තියක් පිළිබඳ මතකයකි. පොල්ගෙඩියෙහි චලිතයෙහි සන්තතික නොව අසන්තතික වෙනසක් සිදු වී ඇත.

මෙයින් පැහැදිලිවන කරුණක් නම් මතකයක් ඇත්තේ ම වෙනසක් සිදුවන බැවින් ය යන්න ය. යම් අයුරකින් පොල්ගෙඩියෙහි කිසිම වෙනසක් නොසිදුවිණි යැයි සිතමු. පොල්ගෙඩිය පොල්ගස මුදුනෙහි කිසිම වෙනසක් නැතිව ඇතැයි සිතමු. මේ සිතාගැනීමට පවා තරමක් අපහසු අදහසකි. මෙහි දී පොල්ගෙඩිය පමණක් නොව පොල්ගස ද, අනෙක් පොල්ගස් ද, අනෙක් ගස් ඇතුළු සියල්ලක් ම නො වෙනස් ව පැවතිය යුතු ය. එවැනි අවස්ථාවක පොල්ගෙඩියට මතකයක් තිබේ ද? තිබිය යුතු ද?

පරස්පරයක් ලෙස පෙනීගිය ද, පොල්ගෙඩියට මතකයක් ඇත්තේ වෙනස්වීම නිසා ය. එමෙන්ම පොල්ගෙඩියට මතකයක් තිබිය යුත්තේ වෙනස් වීම සඳහා ය. ලෝකයෙහි කිසිම වෙනසක් සිදු නොවේ නම් (පොල්ගෙඩිය නිරන්තරයෙන් ම පොල්ගස උඩ නොවෙනස් ව ඇත්නම්- උදාහරණයක් ලෙස ගතහොත් එයට කුරුම්බැට්ටියක් වශයෙන් පවතින කාලයක් නොතිබිය යුතු ය - පොල් ගස ද අනෙක් වස්තු ද වෙනස් නොවන්නේ නම්) කිසිවකට කිසිවක් පිළිබඳ මතකයක් නැත. එහෙත් නැවතත් කිව යුත්තේ මතකය යන්න ද මිනිසා විසින් නිර්මාණය කර ඇති අදහසක් පමණක් වන බව ය.

අපි දැන් වස්තු වැනි අප්‍රාණික දේ අත්හැර ප්‍රාණීන් ගැන සිත යොමු කරමු. විශේෂයෙන් ම මිනිසුන් පිළිබඳ අපේ අවධානය යොමු කරමු. මිනිසුන්ට මතකයක් ඇත. එමෙන් ම මිනිසුන්ට අප්‍රාණික වස්තුවලට නොමැති තවත් දේ ද ඇත. මිනිසුන්ට පමණක් නොව සතුන්ට ද තමන් විසින් ම ගනු ලබන තීරණ මත පදනම් වී කටයුතු කළ හැකි ය. පොල් ගෙඩියක් නටුවෙන් ගිළිහුණු කල පොළොවට වැටිය යුතු ය. එසේත් නැතහොත් යම් වස්තුවක් යම් දිශාවකට ප්‍රක්ෂේපණය කළහොත් එය නිශ්චිත පෙතක ගමන්කළ යුතු ය. එහෙත් සතුන්ට විශේෂයෙන් ම මිනිසුන්ට එසේ වන්නේ නො වෙයි. මිනිසුන්ට තමන්ට අවශ්‍ය ආකාරයට තම හැකියාවන්ට අනුව යම් පෙතක ගමන්කළ හැකි ය. යම් යම් අවශ්‍යතාවන්ට යටත්ව වැඩක් කිරීමට හෝ නොකිරීමට හෝ මිනිසුන්ට හැකි වෙයි. මිනිසුන්ට ඇති මේ නිදහසට බටහිර දාර්ශනිකයෝ ස්වච්ඡන්දය (freewill) යැයි කියති.

© Prof. Nalin De Silva

මේ ස්වච්ඡන්දය ඇත්තේ මිනිසුන්ට පමණක් යැයි ද බටහිරයෝ සිතති. එහෙත් සතුන්ට ද යම් ප්‍රමාණයකට හෝ තීරණ ගැනීමට නිදහසක් ඇති බව පැහැදිලි ය. පාර හරහා යෑමට දුව එන බල්ලන් මෝටර් රථ දැක හෝ එහි ශබ්දය ඇසී හෝ ආපසු හැරෙන අවස්ථා අපි දැක ඇත්තෙමු. එය ස්වච්ඡන්දයක් නොව යම් ජෛවීය ප්‍රතිචාරයක් පමණක් යැයි ඇතැම් බටහිර විද්‍යාඥයෝ කියති. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි විද්‍යාවට මිනිසා අනෙක් සතුන්ගෙන් වෙන්කිරීමේ අවශ්‍යතාව වෙයි.

මිනිසුන්ට ඇති ස්වච්ඡන්දය පවා තීරණ ගැනීමට ඇති නිදහසක් නොව යම් යම් ජෛවීය හා රසායනික ක්‍රියාකාරකම් නිසා ඇතිවන ඵලයක් ලෙස තේරුම්කිරීමට උත්සාහකරන බටහිර බුද්ධිමත්තු වෙති. පොල්ගෙඩියේ ගමන් මග ආරම්භක ප්‍රවේගය මත හා ගුරුත්වාකර්ෂණ බලය (ක්ෂෙත්‍රය) මත තීරණය කෙරෙන අන්දමට මිනිසුන්ගේ ගමන්මාර්ග ද ජෛවීය රසායන හා වෙනත් භෞතික හේතු මත තීරණය වන්නේ යැයි පෙන්වීමට ඔවුහු උත්සාහ දරති. මේ එක් ආකාරයක නියතිවාදයකි. ඒ අනුව මිනිසුන්ට භෞතික හා ජෛවීය හේතු නිසා යම් යම් දේ කිරීමට බල කෙරෙයි. මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ මිනිස් මනස හුදෙක් භෞතික හා ජෛවීය හේතු නිසා ඇතිවන්නක් බව නිගමනය කිරීම ය. ඒ අනුව මනස ද භෞතිකයෙහි ම ප්‍රතිඵලයකි. ඒ මතයට අනුව මනස මොළය හා අතැම් විට කොඳු ඇට පෙළ හා ස්නායු නිසා ඇතිවන්නක් බැවින් මිනිසකුගේ භෞතික මරණයෙන් පසු සියල්ල කෙළවර වෙයි.

අපි මේ මතය බැහැර කරමු. එකම බීජයෙන් ඇති වී එකම පරිසරයක හැදෙන වැඩෙන නිවුන් සොහොයුරන් වෙනස් මනස් ඇතිව ක්‍රියාකරන්නේ කෙසේ දැයි ඉන් තේරුම් ගතහැකි නො වෙයි. මිනිසුන්ට මෙන් ම වෙනත් සතුන්ට ද මනස් ඇති බවත් ඒ භෞතික ශරීරය සමග බැඳී තිබුණ ද එයට ස්වාධීන පැවැත්මක් ඇති බවත් අපි පිළිගනිමු. දැන් අපේ ප්‍රශ්නය වනුයේ මනසේ මතකයක් ඇතිවීමට කුමක් හේතුවන්නේ දැයි තේරුම්ගැනීම ය. මෙහි දී තවත් කිවයුත්තක් ඇත. මතකයෙහි ඇති වැදගත් ම ගුණය වනුයේ, කලින් ද සඳහන් කර ඇති පරිදි, සමුද්ධරණය (retrieval) නමින් හැඳින්වෙන මතකය ආපසු කැඳවීමට ඇති හැකියාව ය. මතකය යනු තොරතුරු (විඥාපන) එක්රැස්කර තැබීම පමණක් නොව ඒ තොරතුරු ආපසු කැඳවීම ද වෙයි.

ඉතා පැහැදිලිව ම තොරතුරු යනු බහුවාචික වෙයි. එහි ඇත්තේ එක් තොරතුරක් පමණක් නො වෙයි. තොරතුරු යන්නෙහි වෙනසක් වෙනස්වීමක් යන්න ද අඩංගු වෙයි. වෙනස් නොවන්නේ නම් ඇත්තේ එකම තොරතුරක් පමණ ය. එවිට එය මතක තබාගැනීමේ අවශ්‍යතාවක් ද පැන නොනගියි. එයට හේතුව ඒ තොරතුර නිරන්තරයෙන් ම විද්‍යමාන වීම ය. මෙහි නිරන්තරයෙන් ම යන්න කාලය සම්බන්ධ කරගනිමින් නොසිතිය යුතු ය. අතර යන්න මෙහි දී යොදාගැනෙන්නේ සිද්ධි දෙකක් අතර යන අදහසින් ය. සිද්ධි (events) රාශියක් ඇත්නම් සිද්ධි අතර තවත් සිද්ධි තිබෙනු විය හැකි ය. එහෙත් ඇත්තේ එකම සිද්ධියක් පමණක් නම් එවිට සිද්ධි අතරක් නැත. තොරතුරු ඇත්තේ සිද්ධි සම්බන්ධයෙන් ය. එක් තොරතුරක් පමණක් ඇතැයි යන්නෙන් අදහස්වන්නේ එක් සිද්ධියක් පමණක් ඇතැයි යන්න ය.

මේ සියල්ලෙන් පැහැදිලිවන කරුණ නම් මතකය ඇතිවීමට ප්‍රධාන වශයෙන් ම හේතුවන්නේ වෙනස්වීම බව ය. එහෙත් වෙනස්වීම යනුවෙන් සංකල්පයක් ඇතිවන්නේ කෙසේ ද? වෙනස්වීම යන සංකල්පය ඇතිවීමට නම් පළමුව වෙනස් නො වීම යන සංකල්පය තිබිය යුතු ය. අපේ පළමු ගැටළුව මේ වෙනස් නොවීම සම්බන්ධයෙන් ය. අප වෙනස්වන්නේ ය යන සංකල්පය ඇතිකරගන්නේ වෙනස් නොවන වස්තුවක් පිළිබඳ ව මුලින් ම සංකල්පයක් ඇතිකරගන්නා බැවින් ය.  අපට පුටුවක් නැත්නම් මිනිසකු පිළිබඳ සංකල්පයක් වෙයි. එහි වෙනස් නොවන අවස්ථායිභාවයක් (substantive state), ආත්මයක්, ඇතැයි අපි සලකමු. පුටුව දිරාපත් වී ගිය ද පුටුවෙහි අවස්ථායිභාවය වෙනස් නොවන්නේ යැයි අපි සිතමු. මිනිසුන් හා සතුන් සම්බන්ධයෙන් ද එසේ ය. මිනිසකු ඉප දී වැඩී මියගිය ද වෙනස් නොවන ආත්මයක් ඇතැයි අපි සලකමු. බෞද්ධයෝ ද මේ ආත්මවාදී සිතිවිලි දරති. බෞද්ධයන් ආත්මයක් යනුවෙන් දෙයක් නැතැයි සැලකුව ද එය හුදු බුද්ධි සංකල්පයක් පමණකි. මම යන හැඟීම අප සියළු දෙනාට ම ඇත.

ඇතැම් බෞද්ධයන් ආත්මයක් නැතැයි යනුවෙන් සලකමින් පුනබ්භවය හෝ පුනරුත්පත්තිය තේරුම්කරදීම සඳහා ඉදිරිපත්කරන නිදර්ශන දෙස බලන විට පෙනෙන්නේ ඔවුන් බුද්ධි සංකල්පයක් ලෙසවත් ආත්මවාදය බැහැරකර නැති

© Prof. Nalin De Silva

බව ය. මේ සම්බන්ධයෙන් ධර්මධර භික්ෂූන් වහන්සේ ද වැරදි මත දරණ බව පැහැදිලි ය. තමන්වහන්සේ බටහිර විද්‍යාව ද දන්නා බව ඇඟවීමට තැත්කරන එක් භික්ෂූන් වහන්සේ නමක් මරණින් මතු එක් ශක්ති විශේෂයක් නිකුත්වන්නේ යැයි පුන පුනා කියති. උන්වහන්සේ තරංග ගැන ද කතාකරති. එහෙත් බටහිර විද්‍යාවේ විද්‍යුත් චුම්බකවාදයෙහි සඳහන්වන තරංග මුහුදු තරංග හෙවත් රැලිවලට සර්වප්‍රකාරයෙන් ම සමානවන බවක් නොකියැවෙයි. මුහුදු රැලි කැඩී කැඩී යන බව සැබෑ නමුත් විද්‍යුත් චුම්බකවාදයෙහි සඳහන්වන තරංග මුහුදු රැලි මෙන් කැඩෙන තරංග නො වෙයි. එමෙන් ම ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි සඳහන්වන තරංග විද්‍යුත් චුම්බකවාදයෙහි සඳහන්වන තරංගවලට ද වඩා වෙනස් ය. තරංග යන නම තිබූ පමණින් සියල්ල එක හා සමාන නො වෙයි.

ශක්තිය යන්න ද එසේ වරදවා යොදාගන්නා සංකල්පයකි. කර්ම ශක්තිය යන්න අප සාමාන්‍යයෙන් භාවිතාකරන සංකල්පයක් වුවත් එය තාප ශක්තිය හෝ විද්‍යුත් චුම්බක ශක්තිය හෝ වැන්නක් නො වෙයි. මනෝකාය වැනි සංකල්ප විස්තරකිරීමේ දී ශක්තියක් ලෙස එය විස්තර කරන්නේ කිනම් අර්ථයකින් ද යන්න පවා පැහැදිලි නැත. එහෙත් නිශ්චිත ව වචන යොදාගැනීමට නුහුරු බොහෝ බෞද්ධයන්ට මේ ප්‍රශ්න නො වෙයි. මෙහි ඇති භයානක ම ප්‍රතිඵලය නම් මරණින් මතු එලෙස ශක්තියක් ලෙස යමක් සිරුරෙන් පිටවෙන්නේ යැයි කීමෙන් ආත්මවාදය තහවුරු වීම ය. ඊනියා ශක්තියක් ගැන කතාකිරීමෙන් ආත්මවාදයෙන් පිටපැනිය හැකි නො වෙයි. ආත්මවාදය බලපවත්වන්නේ ජීවියකු ගැන කතාකරනවිට පමණක් නො වෙයි. පුටුවක් ගැන කතාකරන විට ද එතන ඇත්තේ ආත්මවාදයකි. පුටුව යනුවෙන් අවස්ථායිභාවයක් ඇතැයි එහි දී සැලකෙයි. ශක්තියක් ගැන කතාකරන විට ද නොනැසෙන අවස්ථායිභාවයක් එහි ඇතැයි සැලකෙයි. බටහිර විද්‍යාවේ නම් ශක්තිය සංස්ථිතියක්, එනම් විනාශ නොවන දෙයක් බව මේ බටහිර විද්‍යාව හා බුදුදහම මිශ්‍රකිරීමට තැත්කරන ඇතැම් උගත්තු නොදනිති. අවාසනාව සමාජයේ වැදගත් තැන් උසුලන ඕල්කට් බෞද්ධයන් වූ මොවුන් කියන දේ සාමාන්‍ය සිංහල බෞද්ධයන් ද විශ්වාසකිරීමට පෙළඹීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva